# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1851 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 15/12/2024<br>පැය 1055 |

## මාධ්‍ය නිවේදනය

### ක්‍රිකට් තරඟ ජයග්‍රහණයක් - පොලිස් ක්‍රීඩා කොට්ඨාසය.

රාජ්‍ය සේවා ක්‍රිකට් සංගමය මඟින් සංවිධානය කරනු ලැබූ 2024 පන්දුවාර 20-20 ක්‍රිකට් තරඟාවලිය 2024 අගෝස්තු මස 29 වන දින සිට 2024 දෙසැම්බර් 12 දින දක්වා කොළඹ ආශ්‍රිත ක්‍රිකට් ක්‍රීඩාංගන වලදී පැවත්විණි. මෙම තරඟාවලිය සඳහා ශ්‍රී ලංකා පොලිස් ක්‍රිකට් ක්‍රීඩා සංගමය සහභාගී වී එහි ශූරතාවය හිමි කරන ගන්නා ලදී.

ශ්‍රී ලංකා පොලිස් ක්‍රිකට් කණ්ඩායම, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තු කණ්ඩායමට එරෙහිව සහ ශ්‍රී ලංකා රේගුව කණ්ඩායමට එරෙහිව තරඟ ජයගත් අතර දෙහිවල ගල්කිස්ස මහ නගර සභා කණ්ඩායම අතර තරඟය ජය පැරදුමෙන් තොරව අවසන් කර අවසන් පූර්ව තරඟයට සුදුසුකම් ලැබීය.

2024 පන්දු වාර 20-20 ක්‍රිකට් තරඟාවලියේ අවසන් මහා තරඟය ශ්‍රී ලංකා පොලිස් කණ්ඩායම සහ පොලිස් විශේෂ කාර්ය බලකා කණ්ඩායම අතර 2024.12.12 වන දින බම්බලපිටිය පොලිස් ක්‍රීඩාංගනයේදී පැවැත්විය. එහිදී ශ්‍රී ලංකා පොලිස් ක්‍රිකට් කණ්ඩායම තරඟවලියේ ශූරතාවය හිමිකර ගන්නා ලදී.

තරඟාවලියේ දක්ෂතම පිතිකරු ලෙස ශ්‍රී ලංකා පොලිස් ක්‍රිකට් කණ්ඩායමේ උප පොලිස් පරික්ෂක දනුෂ්ක ප්‍රනාන්දු විසින් සම්මාන හිමිකර ගත් අතර, තරඟාවලියේ දක්ෂතම පන්දු යවන්නා ලෙස පොලිස් විශේෂ කාර්ය බලකා කණ්ඩායමේ පොලිස් සැරයන් 61544 සමන් ආරියසේන විසින් සම්මාන හිමිකර ගන්නා ලදී.

ශ්‍රී ලංකා පොලිස් ක්‍රිකට් සංගමයේ සභාපති ලෙස ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා කටයුතු කරන අතර ලේකම් ලෙස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කමල් පුෂ්පකුමාර මහතා කටයුතු කරයි. පුහුණුකරු පොලිස් සැරයන් 42292 වරුණ රාමනායක, කළමණාකරු ප්‍රධාන පොලිස් පරික්ෂක නිලමේ සමරකෝන්, කණ්ඩායම් නායකයා ලෙස පොලිස් සැරයන් 40246 මහේෂ් ප්‍රියදර්ශන යන නිලධාරීන් කටයුතු කරයි.

**මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්**




**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**